# අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස සහ නව මාධ්‍ය සංස්කෘතිය

## ලුහුඬු සමාලෝචනය

දෙසැම්බර් 2021




HELVETAS SRI LANKA

SDJF

25 ipid Institute for Participatory Interaction in Development

Leading in Participatory Development

# අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස සහ නව මාධ්‍ය සංස්කෘතිය

## ලුහුඬු සමාලෝචනය

## දෙසැම්බර් 2021


**වියාචනය:**

මෙම ප්‍රකාශනය යුරෝපා සංගමයේ මූල්‍ය අනුගහයෙන් එළි දක්වන ලද්දකි. මෙහි අන්තර්ගතය සම්බන්ධ සියලු වගකීම හෙල්වෙටාස් ඉන්ටර්කෝපරේෂන් gGmbH ශ්‍රී ලංකා ආයතනය සහ ශ්‍රී ලංකා සංවර්ධන මාධ්‍යවේදීන්ගේ සංසදය සතු වන අතර යුරෝපා සංගමයේ අදහස් කිසිසේත්ම පිළිබිඹු නොකරයි..

## විධායක සාරාංශය

පසුගිය දශකය තුළ, සමාජ මාධ්‍ය වේදිකා සහ අනෙකුත් නව මාධ්‍යවල ජනප්‍රියත්වය හරහා ශ්‍රී ලංකා ඩිජිටල් මාධ්‍ය ක්ෂේත්‍රයෙහි සීඝ්‍ර වර්ධනයක් සිදු වී ඇත [1]. සාම්ප්‍රදායික මාධ්‍ය අභිබවා යමින් සමාජ මාධ්‍යවල ඉහළ නියැලීමක්, මාර්ගගත ඉගෙනුම සහ රැකී රක්ෂා කිරීමේ වර්ධනයත් සමඟ දුර සිට වැඩ කිරීමේ පරිවර්තනයක් සහ ඩිජිටල් මාධ්‍ය පරිශීලනයේ සමස්ථ වැඩිවීමක්, සිදු වී ඇති බැවින් කොවිඩ්-19 වසංගතය ලොව පුරා ඩිජිටල් මාධ්‍ය භූ දර්ශනය (landscape) පුළුල් කර ඇත.

හෙල්වෙටාස් ඉන්ටර්කෝපරේෂන් gGmbH ශ්‍රී ලංකා ආයතනය සහ ශ්‍රී ලංකා සංවර්ධන මාධ්‍යවේදීන්ගේ සංසදය (SDJF) විසින් ක්‍රියාත්මක කරන තොරතුරු අයිතීන් සහ අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස ප්‍රවර්ධනය කිරීම සඳහා වූ ඉන්කියුබේටර් අවකාශයන් (InSPIRE) ව්‍යාපෘතිය යටතේ ශ්‍රී ලංකාවේ "අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස සහ නව මාධ්‍ය සංස්කෘතිය" පිළිබඳව ජාතික මට්ටමින් පුළුල් පර්යේෂණයක් සිදු කරන ලදී.



රූප සටහන 1: සහභාගීවූවන් පිළිබඳ සාමාන්‍ය තොරතුරු

මෙම පර්යේෂණයේ සමස්ථ අරමුණ වන්නේ ශ්‍රී ලංකාව තුළ ප්‍රකාශනයේ නිදහස ප්‍රවර්ධනය කිරීම සඳහා නව මාධ්‍ය භාවිතය සහ නව මාධ්‍ය සංස්කෘතිය හා නව මාධ්‍ය භූ දර්ශනය පිළිබඳ පුළුල් අවබෝධයක් ලබා ගැනීමයි. ශ්‍රී ලංකාවේ නව මාධ්‍ය භූ දර්ශනය තක්සේරු කිරීමේදී ප්‍රධාන ක්‍රියාකාරීන් හා පාර්ශවකරුවන්, නව මාධ්‍ය ආයතනවල ප්‍රධාන පාරිභෝගිකයින්, පරිශීලකයින්ගේ හැසිරීම් රටා සහ නව මාධ්‍යයන්හි අදහස් ප්‍රකාශ කිරීමට ඇති නිදහසේ සමස්ථ පාරිසරික තත්ත්වය පිළිබඳව මෙම පර්යේෂණය මගින් ගැඹුරු අවබෝධයක් ලබා ගන්නා ලදී.

වයස අවුරුදු 15 ත් 29 ත් අතර තරුණ තරුණියන් විසින් භාවිතා කරනු ලබන නව මාධ්‍යය වේදිකා (platforms) කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින් අන්තර් ක්‍රියාකාරී සහභාගිත්ව සංවර්ධන ආයතනය (IPID) විසින් මුළු දිවයිනම (පළාත් නවයම) ආවරණය කරමින් මෙම අධ්‍යයනය සිදු කරන ලදී. තවද, වයස අවුරුදු 15 සිට 19 දක්වා වයස් පරාසය තුළ වර්ගීකරණය කරන ලද අයගේ දෙමාපියන් බලපෑම්කාරී කණ්ඩායම ලෙස තෝරා ඔවුන් වෙත සමීක්ෂණ ප්‍රශ්ණාවලියක් යොමු කරන ලදී. නව මාධ්‍ය පිළිබඳව ඔවුන්ගේ අදහස සහ දරුවන් කෙරෙහි ඔවුන්ගේ හැසිරීම මෙන්ම, දරුවන් ශ්‍රී ලංකාවේ නව මාධ්‍යවල නිරත වීමට ඔවුන්ගේම මැදිහත්වීම පිළිබඳ වැඩිදුර විශ්ලේෂණය කිරීම එහි අරමුණ විය.

මෙම අධ්‍යයනය 2021 ජූලි සිට 2021 දෙසැම්බර් දක්වා කාලය ඇතුලත සිදු කරන ලද බැවින් මෙම පර්යේෂණයේ සොයා ගැනීම් සහ නිගමනයන් 2021 ජූලි සිට 2021 දෙසැම්බර් දක්වා වූ කාල පරාසය ආවරණය කරනු ලබයි.


මෙම අධ්‍යයනයේදී යොදා ගන්නා ලද මුළු ප්‍රශ්නාවලි සංඛ්‍යාව 1365 ක් වන අතර සමීක්ෂණය මෙහෙය වූ IPID ආයතනය විසින් දත්ත රැස් කිරීම සඳහා එක් එක් දිස්ත්‍රික්කය තුළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ නිශ්චිතව හඳුනාගත් අතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයකට වෙන් කරන ලද අවම නියැදි ප්‍රමාණය 15 කි. හම්බන්තොට, මඩකලපුව සහ රත්නපුර දිස්ත්‍රික්ක හරුණු විට අනෙකුත් සියලුම දිස්ත්‍රික්ක සඳහා යෝජිත වූ නියැදි ප්‍රමාණය 100% ක් සම්පූර්ණ කර ගැනීමට හැකි විය. ඉහත සඳහන් කරන ලද දිස්ත්‍රික්ක තුනට අදාල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල නියැදිය 100% ක් දක්වා සම්පූර්ණ කරගත නොහැකි වීමට කොවිඩ්-19 වසංගතයේ උග්‍රවන තත්ත්වය හේතුවෙන් රජය විසින් පනවා තිබු දැඩි සංචරණ සීමාවන් හේතු විය.

[1] Selvarajah Thuseethan & Shanmuganatha Vasanthapriyan (2015) Social Media as a New Trend in Sri Lankan Digital Journalism: A Surveillance

## පර්යේෂණයේ ප්‍රධාන අනාවරණයන්


### *ශ්‍රී ලංකාවේ අන්තර්ජාල භාවිතය*

සමීක්ෂණයේ ප්‍රධාන නියැදි කණ්ඩායම වන වයස අවුරුදු 15 සිට 29 දක්වා වයස් කාණ්ඩවල තරුණ තරුණියන්ගෙන් අන්තර්ජාලය භාවිතය පිළිබඳ විමසූ විට ඔවුන්ගෙන් 96% ක් අන්තර්ජාලය භාවිතා කරන බවට ප්‍රතිචාර දක්වා ඇති අතර බලපෑම් කණ්ඩායමේ අයගෙන් 65% ක් එම ප්‍රශ්නයට ඔව් යනුවෙන් ප්‍රතිචාර දක්වා ඇත. එමෙන්ම, වයස අවුරුදු 15 සිට 29 දක්වා වයස් කාණ්ඩයේ අයගෙන් 65.6% ක් තමන් "දිනකට කිහිප වතාවක්" අන්තර්ජාලය භාවිතා කරන බවත්, 13.1% ක් "දිනකට වරක්" අන්තර්ජාලය භාවිතා කරන බවත්, 18.3% ක් "සතියට දෙතුන් වතාවක්" අන්තර්ජාලය භාවිතා කරන බවත් ප්‍රකාශ කර ඇත.




රූප සටහන 2: ඔබ කොපමන වාරයක් අන්තර්ජාලය භාවිතා කරනවාද (අවුරුදු 15-29)?


එබැවින් වයස අවුරුදු 15 සිට 29 දක්වා වයස් කාණ්ඩවල සැලකිය යුතු බහුතරයක් (78.7%) අන්තර්ජාලය දෛනිකව භාවිතා කරන බව පෙන්වන අතර ඔවුන් ක්‍රියාකාරී පරිශීලකයින් ලෙස සැලකිය හැකිය. ශ්‍රී ලංකාවේ නව මාධ්‍ය භූ දර්ශනය අනුරූපණය කිරීමේදී, ශ්‍රී ලංකාවේ තරුණ තරුණියන් (අවුරුදු 15 සිට 29 දක්වා) විසින් අන්තර්ජාලය හා නව මාධ්‍යයන් සමග ඉහළ සම්බන්ධතාවයකින් කටයුතු කරන බව මින් පෙන්නුම් කරන අතර එමගින් රට තුළ අන්තර්ජාල භාවිතා කරන්නන්ගේ සක්‍රීය ඩිජිටල් පැවැත්මක් පෙන්නුම් කරයි.




රූප සටහන 3: වැඩි වශයෙන් භාවිතා කරනු ලබන සමාජ මාධ්‍ය වේදිකා

තරුණ තරුණියන්ගෙන් 69.4% ක් තමන්ගේම ස්මාර්ට් ජංගම දුරකථනය භාවිතා කරමින් අන්තර්ජාලයට පිවිසෙන අතර 26.9% ක් වෙනත් අයෙකුගේ ස්මාර්ට් ජංගම දුරකථනයක් ඒ සඳහා භාවිතා කරනු ලබයි. තරුණ තරුණියන් අන්තර්ජාලයට නිරාවරණය වීමේ ආරම්භය බලනවිට, ඔවුන්ගෙන් 78.5% ක් අන්තර්ජාලය භාවිතා කරන ආකාරය සහ එහි අන්තර්ගතයන්ට ප්‍රවේශවීම සහ අන්තර්ජාලය තුළ සැරිසැරීම තමන් විසින්ම ඉගෙන ගත් බව ප්‍රකාශ කරන ලදී. එමෙන්ම 64.5% ක් සෑම විටම බාහිර බලපෑම් වලින් තොරව තමන් විසින්ම අන්තර්ජාලය වෙත පිවිසෙති. අන්තර්ජාලයේ සැරිසැරීමේදී පුද්ගලයන්ට කොපමණ පාලනයක් හෝ ආරක්ෂාවක් තිබේද යන්න දැන ගැනීම වැදගත් වන බැවින් අන්තර්ජාලය හරහා අනාවරණය වීමට හෝ විනිවිදභාවයක් දැක්වීමට තරුණ තරුණියන් දක්වන කැමැත්ත පිළිබඳව මෙය වටිනා අවබෝධයක් ලබා දෙයි.


අවුරුදු 15-19 අතර වයස් කාණ්ඩයේ බහුතරයක් (55.6% ක්) සමාජ මාධ්‍ය වේදිකා වෙත ප්‍රවේශ වීමේ අරමුණින් අන්තර්ජාලය භාවිතා කරන බව පෙන්වා දී ඇත. ඔවුන්ගෙන් 32.1% ක් "දිනපතා" සමාජ මාධ්‍ය භාවිතා කරන බව වාර්තා කළ අතර 23.5% ක් "දිනකට එක් වතාවකට" වඩා සමාජ මාධ්‍ය භාවිතා කරන බව ප්‍රකාශ කරන ලදී. භාවිතා කරන සමාජ මාධ්‍ය අතුරින් ෆේස්බුක්, වට්ස්ඇප් සහ යූටියුබ් වැඩිපුරම භාවිතා කරනු ලැබුවේ වයස අවුරුදු 15-29 දක්වා වයස් කාණ්ඩය හා බලපෑම් කණ්ඩායම යන දෙකෙහිම අය විසිනි. වයස අවුරුදු 15-19 දක්වා වයස් කාණ්ඩයේ අය පුළුල් පරාසයක් තුළ සමාජ මාධ්‍ය වේදිකා භාවිතා කරන බව වාර්තා වූ අතර ඉන්ස්ටොග්‍රෑම්, ටික්ටොක්, ස්නැප්චැට් සහ වයිබර් ඒවා අතර වේ.





රූප සටහන 4: ඔබ කොපමණ වාර ගණනක් සමාජ මාධ්‍ය වේදිකා භාවිතා කරන්නේද (අවුරුදු 15 සිට 29 දක්වා)?

### *මාර්ගගතව (online) හෝ මාර්ගගත නොවී (offline)අදහස් ප්‍රකාශ කිරීම*

දූෂණ සිදුවීම්, ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය හෝ හිරිහැර කිරීම් වැනි නිශ්චිත අවස්ථා ඉදිරිපත් කර එම ගැටලු වාර්තා කරන්නේ කෙසේද යන්න පිළිබඳව විමසූ විට ප්‍රතිචාර දැක්වූවන්ගෙන් බහුතරයක් ඒ සම්බන්ධයෙන් මාධ්‍ය හරහා කිසිවක් නොකරන බවට ප්‍රතිචාර දක්වා ඇත. කෙසේ වෙතත් මාධ්‍යට වාර්තා කරන බව ප්‍රකාශ කළ අය අතර මෙම සිදුවීම් වාර්තා කිරීම සඳහා සමාජ මාධ්‍ය භාවිතා කිරීමේ ඉහළ ප්‍රතිචාර අනුපාතයක් තිබුණි. 83.1% ක් තමන්ගේ ප්‍රදේශයේ මාර්ගය කැඩී ඇති බව වාර්තා කිරීමට, 85.9% ක් දූෂණ සිදුවීම් වාර්තා කිරීමට, 86.2% ක් ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය පිළිබඳ සිදුවීම් වාර්තා කිරීමට සහ 87% ක් හිරිහැර කිරීම්, වධ හිංසා පැමිණවීම් හෝ මරණ වාර්තා කිරීමට සමාජ මාධ්‍ය භාවිතා කරනු ලබයි.




රූප සටහන 5: ඔබ මෙම සිදුවීම් මාධ්‍ය වෙත වාර්තා කිරීම සඳහා තෝරා ගන්නේද? එසේ නම්, ඔබ විසින් එය වාර්තා කිරීමේදී සමාජ මාධ්‍ය භාවිතා කරන්නේද?




රූප සටහන 6: සමාජ මාධ්‍ය වෙත අදහස් ප්‍රකාශ කිරීමේදී ප්‍රතිචාර දක්වන්නන්ට තමන් ආරක්ෂිතයැයි හැඟෙන ආකාරය

### *මාර්ගගතව (Online) අදහස් ප්‍රකාශ කිරීම: සුරක්ෂිතබව පිළිබඳ කරුණු*


සමාජ මාධ්‍ය තුළ තම අදහස් ප්‍රකාශ කිරීමේදී තමන්ට කොතරම් ආරක්ෂිත බවක් දැනේද යන්න සම්බන්ධයෙන් මිශ්‍ර පිළිගැනීමක් ලැබී ඇති අතර, ප්‍රතිචාර දැක්වූවන්ගෙන් 33.9% ක් "බොහෝ දුරට ආරක්ෂිත" යැයි හැඟෙන බවත්, 30.5% ක් "මධ්‍යස්ථ" බවත්, 21.1% ක් "ප්‍රවේශම් සහගත" බවත්, 11.7% ක් "කිසිසේත් ආරක්ෂිත නොවන" බවත් සහ 2.9% ක් "ඉතා ආරක්ෂිත" බවත් ප්‍රකාශ කර ඇත.. සමාජ මාධ්‍ය ඔස්සේ තම මතයන් හා අදහස් ප්‍රකාශ කිරීමට තරුණ තරුණියන් තුළ ඇති දෙගිඩියාවේ ප්‍රබල හැඟීම මෙම ප්‍රතිඵල මගින් පෙන්නුම් කරන අතර ශ්‍රී ලංකාවේ අන්තර්ජාල භාවිතා කරන්නන් අදහස් ප්‍රකාශ කිරීමේදී ඔවුන්ගේ ආරක්ෂාව පිළිබඳව පවතින බිය එයින් පෙන්නුම් කරයි.

### *මාර්ගගතව (Online) අදහස් ප්‍රකාශ කිරීම: නිරවද්‍යතාවය*

අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස පිළිබඳව නිශ්චිත ප්‍රකාශයක් ලබා දී එය ශ්‍රේණිගත කරන මෙන් ප්‍රතිචාරකයින්ගෙන් ඉල්ලා සිටින ලදී. එහිදී, සමාජ මාධ්‍ය මගින් මිනිසුන්ට තම අදහස් නිදහසේ ප්‍රකාශ කිරීමට ඉඩ සලසන බව ප්‍රතිචාර දැක්වූවන්ගෙන් බහුතරයක් ලබා දුන් මධ්‍යස්ථ හෝ ධනාත්මක ප්‍රතිචාරයන් මගින් පෙන්නුම් කරන ලදී. එපමණක් නොව ඔවුන්ගෙන් බහුතරයක් "එකඟ වෙමි" හෝ "දැඩි ලෙස එකඟ වෙමි" යන පිළිතුරු ලබා දී ඇත්තේ සැබෑ ජීවිතයට වඩා සමාජ මාධ්‍යවල අදහස් ඉදිරිපත් කිරීම පහසු බව දැක්වීමටය. භෞතිකව අදහස් ප්‍රකාශ කිරීමට වඩා ඉහළ ප්‍රකාශන නිදහසක් ඩිජිටල් භූ දර්ශනය තුළ ඇති බව ප්‍රතිචාර දක්වන්නන්ට හැඟෙන බැවින් සැබෑ ජීවිතය හා ඩිජිටල් ජීවිතය අතර දෙපැත්තක් ඇති බව මෙයින් පෙන්නුම් කරයි. කෙසේ වෙතත්, කෙනෙකුගේ පුද්ගලික අභිමතය පිළිබඳ පූර්ණ විනිවිදභාවයට ප්‍රතිරෝධයක් පෙන්නුම් කරන ආකාරයට සමාජ මාධ්‍ය තුළ පුද්ගල අනන්‍යතාවය තහවුරු වීම වැදගත් බව සැලකිය යුතු ප්‍රතිශතයක් පෙන්වා දී ඇත.

### *නව මාධ්‍ය හරහා කොවිඩ්-19 පිළිබඳ තොරතුරු ලබා ගැනීම හා බෙදා ගැනීම*

කොවිඩ්-19 පිළිබඳ තොරතුරු සමාජ මාධ්‍ය හරහා ලබා ගන්නා බව ප්‍රතිචාර දැක්වූවන්ගෙන් ඉහළ ප්‍රතිශතයක් (61.8%) ක් පෙන්නුම් කරන ලදී. මෙම තොරතුරු ප්‍රධාන වශයෙන්, එන්නත් ක්‍රියාවලිය (73.9%) ක්, සංචරණ සීමා පැනවීම් (71.5%), ගෝලීය වශයෙන් කොවිඩ්-19 පිළිබඳ තත්ත්වය (61.9%) සහ සෞඛ්‍ය සම්බන්ධ තොරතුරු (61.3%) මත ප්‍රධාන වශයෙන් කේන්ද්‍රගත විය. කොවිඩ්-19 ගෝලීය වශයෙන් මෙන්ම ජාතික වශයෙන් සැලකිය යුතු ලෙස බලපා ඇති බැවින්, තොරතුරුවල විශ්වාසනීයත්වය සහ ප්‍රවේශයේ පහසුව තුළ ඩිජිටල් භූ දර්ශනයේ වෙනසක් කොවිඩ්-19 පිළිබඳ තොරතුරු වෙත සමාජ මාධ්‍ය හරහා ප්‍රවේශ වන අයගේ ඉහළ ප්‍රතිශතය මගින් පෙන්නුම් කරයි.




රූප සටහන 7: කොවිඩ් 19 අතරතුර සඳහා සමාජ මාධ්‍ය භාවිතා කිරීම

## අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස සම්බන්ධ නීතිමය රාමුව

ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 14(1) වගන්තිය යටතේ දක්වා ඇති පරිදි ප්‍රකාශනයේ නිදහස සහතික කල අයිතියකි. මෙයින් කියවෙන්නේ "සෑම පුරවැසියෙකුටම ප්‍රකාශනය ඇතුළුව භාෂණයේ සහ අදහස් ප්‍රකාශ කිරීමේ හිමිකම ඇති" බවයි [2]. කෙසේ වෙතත්, වාර්ගික හා ආගමික සංහිඳියාව, පාර්ලිමේන්තු වරප්‍රසාද, අධිකරණයට අගෞරව කිරීම, අපහාස කිරීම හෝ වරදක් කිරීමට පෙළඹවීම යන කරුණු වලදී මෙම අයිතියට යම් සීමාවන් පනවා තිබේ. මූලික අයිතිවාසිකම් සීමා කිරීම් සම්න්ධයෙන් ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 15(2) වගන්තියේ දක්වා ඇති පරිදි;

> *14.(1)(අ) වගන්තිය මගින් ප්‍රකාශ කර ඇති සහ පිළිගත් මූලික අයිතිවාසිකම් භාවිතයේදී සහ ක්‍රියාත්මක කිරීමේ දී වාර්ගික හා ආගමික සංහිඳියාව, පාර්ලිමේන්තු වරප්‍රසාද, අධිකරණයට අගෞරව කිරීම, අපහාස කිරීම හෝ වරදක් කිරීමට පෙළඹවීම සම්බන්ධයෙන් නීතියෙන් නියම කළ හැකි සීමාවන්ට යටත් විය යුතුය [3].*

එපමණක් නොව, අදහස් ප්‍රකාශ කිරීමේ නිදහසෙහි අවස්ථා ආරක්ෂා කිරීම සඳහා 14 (1) (අ) වගන්තිය සාර්ථකව අධිකරණයට ගෙන ආ සිද්ධි අධ්‍යයනයන් ශ්‍රී ලංකාව තුළ තිබේ. 1993 දී සිදු වූ අමරතුංගට එරෙහිව සිරිමල් සහ තවත් පිරිසක් ගෙන ආ ජන ඝෝෂා නඩුව එවැනි සිද්ධි අධ්‍යයනයකට උදාහරණයකි. විරෝධතාවයකදී බෙර ගසමින් සිටි ශ්‍රිලනිප සාමාජිකයකුට පොලීසිය විසින් එය නවත්වන ලෙස දන්වා සිටි අතර පසුව මුගුරකින් පහර දී බෙරය කඩා ඇත. අනතුරුව විරෝධතාකරුවන් වෙත කඳුළු ගෑස් සහ බැටන් පොලු මගින් ප්‍රහාරයක් එල්ල කර ඔවුන් විසුරුවා හැරීමට කටයුතු කර ඇත. සාමය කඩකිරීමක් සහ අත්අඩංගුවට ගැනීමට පොලීසියට හේතුවක් නොමැති බවත් පෙත්සම්කරුගේ භාෂණයේ සහ අදහස් ප්‍රකාශ කිරීමේ මූලික අයිතිය උල්ලංගනය වී ඇති බවට කරුණු දැක්වීම හේතුවෙන් මෙම නඩුව අධිකරණය වෙත කැඳවා ඇත. එම ප්‍රකාශය පහත සඳහන් පරිදි විය[4].

> *"ආණ්ඩුවට සහ දේශපාලන පක්ෂවලට, ප්‍රතිපත්තිවලට සහ වැඩසටහන්වලට සහාය දැක්වීමට හෝ විවේචනය කිරීමට ඇති අයිතිය ප්‍රජාතන්ත්‍රවාදී ජීවන රටාවට මූලික වන අතර, සියලු සිවිල් හා*

[2] https://www.srilankalaw.lk/constitution-of-the-democratic-socialist-republic-of-sri-lanka.html
[3] hhttps://www.srilankalaw.lk/constitution-of-the-democratic-socialist-republic-of-sri-lanka.html
[4] Amaratunga v. Sirimal and Others (Jana Ghosha Case)
https://www.lawnet.gov.lk/wpcontent/uploads/2016/11/029-SLLR-SLLR-1993-1-AMARATUNGA-v.-SIRIMAL-AND-OTHERS-JANAGHOSHA-CASE.pdf

*දේශපාලන ආයතනවල පදනම මත පිහිටා ඇති නිදහස සහ යුක්තිය පිළිබඳ එම මූලික මූලධර්මය උල්ලංඝනය නොකර භාෂණයේ සහ ප්‍රකාශනයේ නිදහස ප්‍රතික්ෂේප කළ නොහැකි එකකි."*

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 14(ඈ) වගන්තිය මගින් මූලික අයිතිවාසිකම්වලට ගරු කිරීම, සුරක්ෂිත කිරීම සහ ඉදිරියට ගෙන යාම සඳහා අධිකරණය වෙත පැවරී ඇති වගකීම සම්බන්ධයෙන් 14(1)(අ) වගන්තිය යටතේ පෙත්සම්කරුගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වන බවට අධිකරණය විසින් තීන්දු කරන ලදී. රාජ්‍ය බලය ක්‍රියාත්මක කිරීමේදී 126(4) වගන්තිය යටතේ, පුරවැසියාගේ භාෂණයේ සහ ප්‍රකාශනයේ මූලික අයිතියට ගරු කරන බවත්, සාමකාමී විරෝධතා යටපත් නොකරන බවත් සහතික කිරීම පිනිස පොලිසියට උපදෙස් ලබා දීම සඳහා රාජ්‍ය බලය ක්‍රියාත්මක කිරීම සාධාරණීකරණය කරයි. මෙහි අත්‍යවශ්‍යම දේ නම්, අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස මහජනතාවගේ සාමූහික අවශ්‍යතා සමඟ ප්‍රතිසංධානගත කිරීමය [5].

වෛරී ප්‍රකාශය සම්බන්ධයෙන්, සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතියේ (ICCPR) 20 වැනි වගන්තියේ යටතේ "වෙනස් කොට සැලකීම, සතුරුකම හෝ ප්‍රචණ්ඩත්වයට උසි ගැන්වීමක් වන ජාතික, වාර්ගික හෝ ආගමික වෛරය වෙනුවෙන් පෙනී සිටින ඕනෑම දෙයක් නීතියෙන් තහනම් කළ යුතුය" යනුවෙන් සඳහන් කරයි. ICCPR පනතේ 3 වැනි වගන්තිය යටතේ "කිසිම පුද්ගලයෙක් යුද්ධය ප්‍රචාරය නොකළ යුතු හෝ වෙනස් කොට සැලකීම, සතුරුකම හෝ ප්‍රචණ්ඩත්වයට උසි ගැන්වීමක් වන ජාතික, වාර්ගික හෝ ආගමික වෛරය වෙනුවෙන් පෙනී නොසිටිය යුතුය" යනුවෙන් ප්‍රකාශ කිරීමෙන් මෙය තව දුරටත් ශක්තිමත් කරයි. වෛරී ප්‍රකාශයන්ට එරෙහිව සටන් කිරීම සඳහා ශ්‍රී ලංකාවේ ඇති වඩාත්ම ඵලදායි නීති සම්පාදන පනත ICCPR පනත වුවද, එම පනත යටතේ අවසන් කර ඇති නඩු විභාග හෝ විනිශ්චයන් වාර්තා වී නැත[6].

ශ්‍රී ලංකාවේ නෛතික රාමුව තුළ ප්‍රකාශනයේ නිදහස සීමා කිරීම සඳහා වූ මෙම පුළුල් පරාමිතීන් විසින් මෙම අයිතිය ආයතනික වශයෙන් ප්‍රතික්ෂේප කළ හැකි අවකාශය නිර්මාණය කර ඇත.

සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය (ICCPR) පනතේ 3(1) වගන්තිය යටතේ, වෙනස් කොට සැලකීමේ ප්‍රචණ්ඩත්වයට හෝ එදිරිවාදිකම්වලට උල්පන්දම් දෙන වෛරය වෙනුවෙන් පෙනී සිටීම තහනම් කර ඇත. නමුත්, සාධාරණ හේතුවක් නොමැතිව සුළුතර ප්‍රජාවන් ඉලක්ක කර ගනිමින් එම පනත අපයෝජනය කිරීම සිදුකර ඇත [7].

1979 අංක 48 දරණ ත්‍රස්තවාදය වැලැක්වීමේ පනත (PTA) මගින් නිශ්චිතව දක්වා නොමැති "නීති විරෝධි ක්‍රියාකාරකම්" සඳහා වරෙන්තුවක් නොමැතිව අත්අඩංගුවට ගැනීම් සිදු කිරීමට බලධාරීන්ට ඉඩ ලබා දෙන අතර සැකකරු අධිකරණයට ඉදිරිපත් නොකර මාස 18 ක කාලයක් දක්වා රඳවා තබා ගැනීමට අවසර ලබා දෙනු ලැබේ[8]. මෙම අතිශය ආන්දොලනාත්මක ක්‍රියාව මානව හිමිකම් උල්ලංඝනය කිරීමට සහ රට පුරා ප්‍රකාශනයේ නිදහස සීමා කිරීම සඳහා භාවිතා කර ඇත - විශේෂයෙන්ම දෙමළ සහ මුස්ලිම් ප්‍රජාවන් සම්බන්ධයෙන්. වසර 40 කට වැඩි කාලයක් මෙම පනත මගින් "දිගුකාලීනව අත්තෝනමතික ලෙස රඳවා තබා ගැනීම, වධහිංසා පැමිණවීම හරහා බොරු පාපෝච්චාරණ ලබා ගැනීම සහ සුළුතර ප්‍රජාවන් සහ සිවිල් සමාජ කණ්ඩායම් ඉලක්ක කර ගැනීම" සක්‍රිය කර ඇත[9]. එපමණක් නොව, ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතේ 14 වැනි වගන්තිය මගින් රැදවියා හෝ විමර්ශනය සම්බන්ධයෙන් කරන ලද ප්‍රකාශයක් ප්‍රසිද්ධ කිරීම තහනම් කරයි. එමගින් මානව හිමිකම් සෘජුවම උල්ලංඝනය කිරීමක් වන අතර විමර්ශනය සඳහා වගවීම සහ වාස්ථවිකත්වය වළක්වයි[10]. 2022 ජනවාරි මාසයේදී සිදු කරන ලද 1979 අංක 48 ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතේ (තාවකාලික විධිවිධාන) සංශෝධණ පනත් කෙටුම්පත ප්‍රකාශයට පත් කරන ලද අතර, නීතිය යටතේ ඇති සමහර අපයෝජනයන් අවම කිරීම සඳහා, මාස 18 ක කාලයක් රඳවා තබා ගැනීම මාස 12 ක් දක්වා අඩු කිරීම වැනි ඇතැම් සංශෝධන ඇතුළත් කර ඇත. කෙසේ වෙතත්, මෙම පනත තවමත් අන්තනෝමතික

[5] https://www.lawnet.gov.lk/freedom-of-expression-and-right-to-information/

[6] Centre for Policy Alternatives (September, 2018) Confronting Accountability for Hate Speech in Sri Lanka: A Critique of the Legal Framework

[7] https://www.icj.org/sri-lank-de-radicalization-regulations-should-be-immediately-withdrawn/

[8] https://monitor.civicus.org/updates/2019/07/05/iccpr-act-and-judicial-system-being-misused-stiflefreedom-expression-sri-lanka/

[9] https://www.hrw.org/report/2022/02/07/legal-black-hole/sri-lankas-failure-reform-preventionterrorism-act

[10] https://english.theleader.lk/news/1749-govt-commences-engagement-with-civil-society-on-ptareforms

ලෙස රඳවා තබා ගැනීමට එරෙහි තහනම උල්ලංඝනය කරන අතර මිනිසුන් අත්අඩංගුවට ගැනීම පහසු කරවන ත්‍රස්තවාදය යන්න සඳහා ද පැහැදිලි නිර්වචනයක් ලබා දෙන්නේ නැත [11].

කොවිඩ්-19 වසංගතයේ සන්දර්භය තුළ ශ්‍රී ලංකා රජය විසින් විධිමත් නීති හෝ ක්‍රියා පටිපාටි නොමැතිව නීති පිළිබඳ පුළුල් අර්ථකථන භාවිතා කරමින් විරුද්ධ මත දරන්නන් අතර ප්‍රකාශනයේ නිදහස සීමා කිරීමට පියවර ගෙන ඇත. පරිඝණක අපරාධ පනත (CCA), පොලිස් ආඥාපනත සහ දණ්ඩ නීති සංග්‍රහයට අනුව කොවිඩ්-19 නිල ප්‍රෝටකෝලය පිළිබඳ අසත්‍ය හෝ අවමන් සහගත ප්‍රකාශ බෙදා හරින ඕනෑම අයෙක් අත්අඩංගුවට ගැනීමට බලධාරීන් විසින් 2020 අප්‍රේල් සහ 2021 ජූනි මාසවලදී හදිසි රෙගුලාසියක් නිකුත් කරන ලදි[12]. කොවිඩ්-19 පරීක්ෂණ වියදම් සහ රජයේ නිලධාරීන්ගේ සාමාන්‍ය වසංගත ප්‍රතිචාරය පිළිබඳ රූපවාහිනී සම්මුඛ සාකච්ඡාවක් මත පදනම්ව අදහස් දැක්වූ සෞඛ්‍ය අමාත්‍යාංශයේ හිටපු ප්‍රකාශක වෛද්‍ය ජයරුවන් බංඩාර වැනි අය විමර්ශනය සඳහා රඳවා තබා ගැනීමට ද මෙය හේතු වී තිබේ [13].

තොරතුරු දැන ගැනීමේ අයිතිය (RTI) 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකමක් ලෙස පැවති අතර එය 2015 දී සිදු කරන ලද 19 වන ව්‍යවස්ථා සංශෝධනයට ඇතුළත් කරන ලදී. අනතුරුව 2016 දී තොරතුරු දැන ගැනීමේ අයිතිය (RTI) පිළිබඳ පනත හඳුන්වා දෙන ලදී [14]. එපමණක් නොව තොරතුරු දැන ගැනීමේ අයිතියෙහි මූලික පාදකය පදනම් වන්නේ යහපාලනය, වගවීම, විනිවිදභාවය සහ තීරණ ගැනීම මතය. තොරතුරු දැන ගැනීමේ අයිතිය මූලික නිදහසක් ලෙස හඳුන්වා දුන්නේ 2015 දී සිදු කරන ලද 19 වැනි සංශෝධනයෙන් වුවද මාධ්‍ය නිදහස ඇතුළු අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස මෙම පනත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට හඳුන්වා දීමේදී පූර්ව සහ පළමු තීරණය ලෙස සලකා බලා තිබුණි. එපමණක් නොව, තොරතුරු දැන ගැනීමේ අයිතිය මගින් තොරතුරු හෙළි කිරීමේ ක්‍රියාවන් (whistle-blowing practices) දිරිමත් කළ යුතු අතර, රේගු, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සහ අයවැය ප්‍රතිපාදන වැනි විශාල ලෙස මහජන මුදල් පරිහරණය කරන රාජ්‍ය දෙපාර්තමේන්තු වඩාත් විනිවිදභාවයෙන් යුක්ත විය යුතු බවට සහතික විය යුතුය. කෙසේ වෙතත්, දිස්ත්‍රික් සහ පරිපාලන මට්ටම් යන දෙකෙහිම රාජ්‍ය ආයතන ජාතික මට්ටමේ ආයතනවලට වඩා හොඳින් ක්‍රියාකර ඇති අතර තොරතුරු දැන ගැනීමේ අයිතියෙහි ක්‍රියාකාරී හෙළිදරව් කිරීම් සහ තොරතුරු හෙළිකරන්නන් සඳහා ආරක්ෂාවක් තිබීම මෙම අධ්‍යයනය යටතේ නිරීක්ෂණය වූ එක් ධනාත්මක අංශයකි,

මෑතක දී යෝජනා වූ පුද්ගලික දත්ත ආරක්ෂණ (PDP) පනත් කෙටුම්පත ද එහි ඇතුලත් මතභේදාත්මක වගන්ති සහ අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන් විවේචනයට ලක්ව ඇත[15]. 2022 ජනවාරි මාසයේදී [16] පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී. පුද්ගලික දත්ත ආරක්ෂා කිරීම සඳහා නව නීති අවශ්‍ය වන අතර එය ශ්‍රී ලංකාවේ ව්‍යවස්ථාදායක පද්ධතිය සඳහා වූ මූලික අවශ්‍යතාවයකි. එපමණක් නොව, 2022 මාර්තු 09 වන දින [17] පනත් කෙටුම්පත දෙවන වර කියවීම සිදු කරන බව 2022 මාර්තු 04 වන දින පාර්තිමේන්තුව විසින් තහවුරු කරන ලදී. මෙම පුද්ගලික දත්ත ආරක්ෂණ (PDP) පනත් කෙටුම්පත 2018 දී ක්‍රියාත්මක කරන ලද යුරෝපා සංගමයේ සාමාන්‍ය දත්ත ආරක්ෂණ රෙගුලාසි (GDPR) පනතට අනුව සකස් කර ඇත. කෙසේ වෙතත්, මාධ්‍ය සහ සිවිල් ආයිතිවාසිකම් සංවිධාන අතර බරපතල කනස්සල්ලක් මතු කර ඇති "දත්ත ආරක්ෂණ අධිකාරියේ ස්වාධීනත්වය, මාධ්‍ය අරමුණු බැහැර කිරීම, අමත්‍යවරයාට පැවරී ඇති බලතල, සහ අභියාචනා පිරවීමේ ස්වභාවය සම්බන්ධයෙන් දැඩි දඬුවම් සහ සැක සහිත වගන්ති [18]" පුද්ගලික දත්ත ආරක්ෂණ පනතට (PDPB) ඇතුළත් වී ඇත.

---

[11] Human Rights Watch (2022) "In a Legal Black Hole" – Sri Lanka's Failure to Reform the Prevention of Terrorism Act

[12] https://www.icj.org/sri-lanka-covid-19-restrictions-should-not-undermine-freedom-of-expression/

[13] https://www.icj.org/sri-lanka-covid-19-restrictions-should-not-undermine-freedom-of-expression/

[14] https://www.lawnet.gov.lk/freedom-of-expression-and-right-to-information/

[15] https://www.tisrilanka.org/wp-content/uploads/2021/07/TISL-Legislative-Brief_Personal-DataProtection-Bill_13.07.2021.pdf

[16] https://www.dailymirror.lk/print/front_page/Personal-Data-Protection-Bill-should-not-be-passed-inhaste-NMSJ/238-232729 1

[17] https://www.parliament.lk/news-en/view/2477

[18] https://www.dailymirror.lk/news-features/Personal-Data-Protection-Bill-Another-draconian-law-tosuppress-media-freedom/131-233442

පුද්ගලික දත්ත ආරක්ෂණ පනතේ (PDPB) 35 වන වගන්තිය මගින් මෙයට ප්‍රතිරෝධය දැක්වීම අරමුණු කරයි: "මෙම පනතේ විධිවිධාන සඳහා නිදහස් කිරීම්, සීමා කිරීම් හෝ අවමානයට ලක් කිරීම්, රෙගුලාසි මගින් නියම කර ඇති විට හැර එවැනි කටයුතුවලට ඉඩ නොදේ. මූලික අයිතිවාසිකම් සහ නිදහස සහ පුද්ගලයින්ගේ අයිතිවාසිකම් සහ මූලික නිදහස, විශේෂයෙන්ම අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස සහ තොරතුරු දැන ගැනීමේ අයිතිය ආරක්ෂා කිරීම සඳහා කටයුතු කිරීම ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක අත්‍යවශ්‍ය සහ සමානුපාතික පියවරක් වේ" [19].

කෙසේ වෙතත්, එය අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස උල්ලංඝනය කිරීමක් ද යන්න තීරණය කිරීමේදී දත්ත ආරක්ෂණ අධිකාරියේ හෝ පාලකයේ කාර්යභාරය ප්‍රජාතන්ත්‍රවාදී වටිනාකම් ආරක්ෂා කිරීමට තර්ජනයක් වේ. තවද, පුද්ගලික දත්ත ආරක්ෂණ (PDP) පනත් කෙටුම්පත සඳහා යුරෝපා සංගමයේ සාමාන්‍ය දත්ත ආරක්ෂණ රෙගුලාසි (GDPR) හි 85 වැනි වගන්තිය නොසලකා හැරීම තව දුරටත් කනස්සල්ලට හේතු වී ඇති අතර එහි සඳහන් වන්නේ "ශාස්ත්‍රීය, කලාත්මක හෝ සාහිත්‍යමය ප්‍රකාශනයේ අරමුණුවලට අමතරව මාධ්‍යවේදියාගේ අරමුණු ද ප්‍රකාශනයේ නිදහසට ඇතුළත් වේ" යනුවෙනි. එබැවින් පුද්ගලික දත්ත ආරක්ෂණ (PDP) පනත් කෙටුම්පත පුද්ගලික දත්තවල ආරක්ෂාවට අනුගත වූ බවට සහතික විය යුතු අතර එය තොරතුරු දැන ගැනීමේ අයිතිය (RTI) පිළිබඳ පනත සහ පුද්ගලික දත්ත ආරක්ෂණ (PDP) පනත එකිනෙක සැසදෙන්නේ නැති බව සහතික කිරීම සඳහා ස්වාධීන අධිකාරී හෝ කොමිෂන් සභා හිගයක් පවතින බැවින් එය මාධ්‍ය අරමුණු සඳහා දත්ත සැකසීමට බාධාවක් නොවන බවට සහතික කළ යුතුය. පරිඝණක අපරාධ පනතට සමානව, තොරතුරු බෙදා හැරීම සඳහා සමාජ මාධ්‍ය වේදිකා වැනි නව මාධ්‍ය ආයතන භාවිතා කිරීමේදී මාධ්‍යවේදීන්ට ඇති බලපෑම සම්බන්ධයෙන් විශේෂයෙන් රාජ්‍ය නිලධාරීන් අතර රාජ්‍ය මර්දනය ක්‍රියාත්මක වන බව මෙම පනත් කෙටුම්පත් මගින් පෙන්නුම් කෙරේ.

වසංගතය හේතුවෙන් අන්තර්ජාල භාවිතය දැඩි ලෙස වර්ධනය වීමත් සමඟ, මෙම ගෝලීය අර්බුදය තුළ නව මාධ්‍ය භාවිතා කරමින් අදහස් ප්‍රකාශ කිරීමේ නිදහසේ අවස්ථා සහ සීමාවන් අවබෝධ කර ගැනීම වඩාත් අදාළ වී තිබේ.

## ශ්‍රී ලංකාවේ නව මාධ්‍ය භූ දර්ශනය (Landscape)

පසුගිය දශකය තුළ ශ්‍රී ලංකාවේ නව මාධ්‍ය භූ දර්ශනය විශාල ලෙස වර්ධනය වී ඇති අතර රට පුරා සිටින පුළුල් ජනගහනයකට අන්තර්ජාල ප්‍රවේශය ලැබී ඇත. එපමණක් නොව, 2020 මුල් භාගයේදී කොවිඩ්-19 වසංගතය පැතිරීම ශ්‍රී ලංකාවට ප්‍රබලව දැනුණු බැවින් ඩිජිටල් මාධ්‍ය හරහා ව්‍යාපාරික මෙහෙයුම් සහ මාර්ගගත ඉගෙනුම් පහසුකම් සිදු කිරීම සඳහා වූ සංක්‍රාන්තිය ඉමහත් ප්‍රමුඛත්වයක් ලබා ඇත.


රූප සටහන 8 හි පෙන්වා ඇති පරිදි, ශ්‍රී ලංකාවේ පරිශීලකයින් වැඩි බහුතරයක් (64% ක්) ස්මාර්ට් ජංගම දුරකථන හරහා අන්තර්ජාලයට පිවිසෙන අතර අඩු ප්‍රතිශතයක් (34.7 ක්) ලැප්ටොප් /ඩෙස්ක්ටොප් උපාංග හරහා අන්තර්ජාලයට පිවිසේ [20]. ශ්‍රී ලංකාවේ වැඩි ජනගහනයක් තම ස්මාර්ට් ජංගම දුරකථන හරහා අන්තර්ජාලය භාවිතා කිරීමට ප්‍රවීනයන් වන බැවින්, එයින් අදහස් කරන්නේ රටේ වැඩි අන්තර්ජාල භාවිතා කරන්නන් සමාජ මාධ්‍ය වේදිකා භාවිතා කිරීමට ඉඩ ඇති බවයි.

ශ්‍රී ලංකාව තුළ කුමන අන්දමේ සමාජ මාධ්‍ය වේදිකා ප්‍රමුඛතාවයක් ගන්නේද යන්න සම්බන්ධව දත්ත වාර්තාව (2021) මගින් ඉස්මතු කරන ලද ප්‍රමුඛතම සමාජ මාධ්‍ය නාලිකා හතරෙහි පරිශීලකයින් සංඛ්‍යාව රූප සටහන 9 මගින් පෙන්වා ඇත. ගෝලීය ප්‍රවනතාවලට සමානව, ෆේස්බුක් යනු ශ්‍රී ලංකාව තුළ වඩාත්ම ජනප්‍රිය සමාජ මාධ්‍ය වේදිකාව වන අතර ආසන්න වශයෙන් මිලියන 7 ක පරිශීලකයින් සංඛ්‍යාවක් එහි සිටී. මැසෙන්ජර් පරිශීලනය කරන්නන් සංඛ්‍යාව ආසන්න වශයෙන් මිලියන 3.8 කි. ඉන්ස්ටග්‍රෑම් සහ ලින්ක්ඩින් මීළඟ ජනප්‍රිය සමාජ මාධ්‍ය වේදිකා දෙක වන අතර එම එක් එක් වේදිකාවක් සඳහා ශ්‍රී ලංකාව තුළ සාමාන්‍ය පරිශීලකයින් සංඛ්‍යාව මිලියන 1.3 ක් වේ.

[19] https://www.icta.lk/icta-assets/uploads/2021/11/Data-Protection-Bill-Nov-2021.pdf
[20] https://datareportal.com/reports/digital2021-sri-lanka




රූප සටහන 9:
ශ්‍රී ලංකාවේ සමාජ මාධ්‍ය වේදිකාවක් සඳහා
පරිශීලකයින් සංඛ්‍යාව




රූප සටහන 8:
ශ්‍රී ලංකා තුළ විද්‍යුත් උපාංග හරහා
අන්තර්ජාලයට ප්‍රවේශ වීම

ජාත්‍යන්තර මාධ්‍ය නිදහස දර්ශකයට අනුව ශ්‍රී ලංකාව සිටින්නේ මාධ්‍ය නිදහසක් නැති කොටස තුළය. ලෝකයේ රටවල් 181 ක් අතුරින් ශ්‍රී ලංකාව එහි 127 වැනි ස්ථානයේ පසුවේ [21]. ජාත්‍යන්තර මාධ්‍ය ප්‍රමිතීන් ගණනය කරන ෆ්‍රීඩම් හවුස් හි 2020 වර්තාවට අනුව, ජාත්‍යන්තර මාධ්‍ය නිදහස දර්ශකයේ අවසන් රටවල් 100 අතර ශ්‍රී ලංකාව 56 වැනි ස්ථානයේ සිටී. දේශපාලන අයිතිවාසිකම් කඩ කිරීම් සම්බන්ධයෙන් රටවල් 60 ක් අතරින් ශ්‍රී ලංකාව 33 වැනි ස්ථානයේ පසුවෙයි. දේශසීමා රහිත වාර්තාකරුවන්ගේ ජාත්‍යන්තර ප්‍රමිති වාර්තාවට අනුව මාධ්‍ය නිදහස් දර්ශකයේ රටවල් 180 ක් අතරින් ශ්‍රී ලංකාව 127 වැනි ස්ථානයට පත්ව ඇත. 2021 වසරේ ෆ්‍රීඩම් හවුස් අන්තර්ජාල නිදහස් දර්ශකයේ ශ්‍රී ලංකාව ලබාගෙන ඇත්තේ ලකුණු 50% ක් පමණි.

2020 දී මාධ්‍ය නිදහසට අවහිර කළ සිදුවීම් 58 ක් වාර්තා වී ඇත [22]. මෙම සිදුවීම් අතර තර්ජනය කිරීම් 13 ක්, බිය ගැන්වීම් 5 ක්, සයිබර් ප්‍රහාර, වෙබ් අඩවි අවහිර කිරීම් සහ විකාශන අත්හිටුවීම ආදිය ඇතුළත් වේ. මාධ්‍යවේදීන්ගේ ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් පොලිසිය සහ ආරක්ෂක අංශ තවදුරටත් අධීක්ෂණය කරමින් සිටින බවද වාර්තා වේ. සමහර ප්‍රවෘත්ති මාධ්‍ය ආයතන විසින් පළ කිරීමට හෝ විකාශනය කිරීමට පෙර මාධ්‍ය හිමිකරුවන්ගේ අනුමැතිය ලබා ගත යුතුය. පුවත් වෙබ් අඩවි ලියාපදිංචි කිරීම සඳහා ආරක්ෂක අංශවල අවසරය ලබා ගැනීම සඳහා නීතියක් ගෙන ඒමේ සූදානමක් ද තිබේ [23]. බොහෝ මාධ්‍ය ආයතනවල ප්‍රවෘත්ති කාමර දේශපාලන න්‍යාය පත්‍ර සහිත ක්‍රියාකාරීන් විසින් පාලනය කරනු ලබන බැවින් ප්‍රවෘත්ති වාර්තාකරුවන්ට පූර්ණ වශයෙන් ස්වාධීනව කටයුතු කිරීමට අපහසු බව මාධ්‍ය සංවිධාන වාර්තා කර ඇත. එසේම සාමාන්‍ය ජනතාවට බලපානු ලබන සැලකිය යුතු අන්දමේ ප්‍රවෘත්ති සඳහා ලැබෙන්නේ සීමිත ආවරණයකි. වරදි තොරතුරු, සාවද්‍ය තොරතුරු සහ ව්‍යාජ පුවත් පතුරුවා හරින අවස්ථා ද තිබේ. එවැනි

[21]https://freedomhouse.org/country/sri-lanka/freedom-world/2020

[22] Free Media Movement (2021) Media Freedom in Sri Lanka – Annual Report: Incidence & Trends. (http://www.fmmsrilanka.lk/wp-content/uploads/2021/08/FMM_2021_Aug_Annual_Eng.pdf)
[23] http://www.dailynews.lk/2018/08/08/local/159142/army-vigilant-over-social-media

වාර්තාකරණයන් ප්‍රශ්ණකාරී වන්නේ අන්තර්ජාල මූලාශ්‍ර කෙරෙහි මහජනතාව තබා ඇති විශ්වාසනීයත්වය සම්බන්ධයෙනි.

මාධ්‍ය නිදහසට බාධා වන ආකාර ගණනාවක් තිබේ. මාධ්‍ය හිමිකරුවන් සහ කතෘවරුන් අනවසරයෙන් බිය ගැන්වීම, මාධ්‍ය හිමියන්ගේ අනෙකුත් ව්‍යාපාරවලට බාධා කිරීම, තර්ජනය කිරීම්, බිය වැද්දීම්, වාර්තාකරණයන්ට බාධා කිරීම්, මාධ්‍ය වේදීන් පිළිබඳ තොරතුරු රැස්කිරීම, මාධ්‍යවේදීන්ට එරෙහිව සංවිධානය වූ පිරිස් විසින් සමාජ මාධ්‍යවල පලකරන වෛරී ප්‍රකාශ, මාධ්‍ය ආයතනවලට පහර දීම, සමාජ මාධ්‍ය සහ වෙබ් අඩවි අවහිර කිරීම, අන්තර්ජාලය අවහිර කිරීම, මාධ්‍ය නිදහස සීමා කරන නීති හඳුන්වා දීම, මාධ්‍ය නිදහසට එරෙහිව විධායකය විසින් ගනු ලබන තීරණ, වාරණය, අත්අඩංගුවට ගැනීම්, ප්‍රශ්ණ කිරීම්, මූලාශ්‍ර සොයා ගැනීම සඳහා විමර්ශණ කිරීම ආදිය ඒ අතර වේ. අපේ රටේ මාධ්‍ය නිදහස විධිමත් හා අවිධිමත් ලෙස අවහිර කිරීමට රජය පසුගිය වසරක කාලය තුළ මැදිහත් වීම් සිදු කර ඇත.

## නිර්දේශ

පර්යේෂණය ඇසුරෙන් පහත සඳහන් නිර්දේශ යෝජනා කරනු ලැබේ:

### *දිස්ත්‍රික් සහ ප්‍රතිපත්ති මට්ටම් කරා ළඟා වීමට ප්‍රජාව සහ බිම් මට්ටමේ හඬවල් සඳහා නව මාධ්‍ය මාර්ග*

1. නව මාධ්‍ය වේදිකා පරාසය (උදා. අන්තර්ජාලය, ජංගම දුරකථන, විද්‍යුත් තැපෑල, සමාජ ජාලකරණය, බ්ලොග්කරණය යනාදිය) පිළිබඳව මහජනතාව දැනුවත් කළ යුතු අතර, මෙම මාධ්‍ය වේදිකා වගකීමෙන් යුතුව අවබෝධ කර ගන්නේ කෙසේද සහ භාවිතා කරන්නේ කෙසේද යන්න පිළිබඳව මෙන්ම, තම අදහස් ඉදිරිපත් කිරීමේදී ඔවුන්ගේ අයිතිවාසිකම් පිළිබඳව වඩා හොඳින් දැනුවත් විය යුතුය.
2. මුල් අවදියේ සිටම මාධ්‍ය සාක්ෂරතා පුහුණුව මගින් පරම්පරා වෙනසක් උත්තේජනය කළ හැකි අතර ධනාත්මක සමාජ වෙනසක් ඇති කිරීම සඳහා නව මාධ්‍ය තාක්ෂණය උපයෝගි කර ගන්නේ කෙසේද යන්න පිළිබඳව බිම් මට්ටමේ ක්‍රියාකාරීන් සහ ප්‍රජා නායකයින් දැනුවත් කළ යුතුය.
3. විශ්වවිද්‍යාල විෂයමාලා සහ මාධ්‍ය පුහුණු ආයතනවල (උදා. SLPI, SLCJ, SLF, MTDC ආදිය) විෂයමාලා නව මාධ්‍ය තාක්ෂණයන් ඇතුළත් වන පරිදි, මාධ්‍යවේදය, සමාජ විද්‍යාව සහ දේශපාලනය වැනි අධ්‍යයන ක්ෂේත්‍රයන්හි විශේෂයෙන් ශ්‍රී ලාංකීය සංදර්භය තුළ නවකයින්ව වැඩි දියුණු කළ තොරතුරු ප්‍රවාහයකින් සන්නද්ධ කිරීමට අනුගත විය යුතුය.

### *නව මාධ්‍ය වේදිකා හරහා අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස පිළිබඳ විවිධ පාර්ශවකරුවන් මුහුණ දෙන සීමාවන් සහ අභියෝග*

1. අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස ප්‍රවර්ධණය කරන නීතිවල පවතින විධිවිධාන එලදායි ලෙස ක්‍රියාත්මක කිරීම සහතික කිරීම සඳහා අවශ්‍ය වන්නා වූ ක්‍රියාමාර්ග ගැනීමට අදාළ බලධාරීන්ට සහ අදාළ නිලධාරීන්ට පහසුකම් සැලසීම.
2. මාර්ගගත (online) හා මාර්ගගත නොවන (offline) අවකාශයන් තුළ අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස සහ තොරතුරු අයිතිය අවහිර කරන දැඩි නීති අවලංගු කිරීම/ සංශෝධණය කිරීම.
3. විශේෂයෙන්ම නව මාධ්‍ය වේදිකාවල තම අදහස් ප්‍රකාශ කිරීමේ දී සහ වගකීම් සහගත පුවත් බෙදා හැරීමේ දී ඔවුන්ගේ අයිතිවාසිකම් සහ වගකීම් පිළිබඳව මහජනතාව දැනුවත් කිරීම.
4. දේශපාලන පක්ෂග්‍රාහිත්වය සහ රජය විසින් කරනු ලබන මැඩ පැවැත්වීම් වලට එරෙහිව ප්‍රමාණවත් යාන්ත්‍රණයක් ඇති බවට මාධ්‍ය ආයතන (උදා. මාධ්‍ය ආයතන, පුවත්පත් ආයතන ආදිය) සහතික විය යුතුය. එමෙන්ම සදාචාරාත්මක සහ සමාජීය වගකීම් සහගත ආකාරයකින් අන්තර්ජාලය හරහා තම අදහස් ප්‍රකාශ කිරීම සම්බන්ධයෙන් ඔවුන්ගේ පිරිස් (උදා. මාධ්‍යවේදීන්, වාර්තාකරුවන් ආදිය) ආරක්ෂා කිරීම සහ පුහුණු කිරීම.
5. වගකීමෙන් යුතු ප්‍රවෘත්ති වාර්තාකරණයක් ප්‍රවර්ධනය කිරීම සහ දේශපාලඥයින්, රජයේ නියෝජිතයන් සහ අනෙකුත් පාර්ශවකරුවන්ගෙන් වගවීම වැඩි කිරීම සඳහා කරුණු පරීක්ෂා කරන සංවිධාන සහ මාධ්‍ය සංවිධාන සහ මාධ්‍ය නිරීක්ෂණ කණ්ඩායම් කෙරෙහි වැඩි අවධානයක් යොමු කිරීම.

### ශ්‍රී ලංකාවේ නව මාධ්‍ය සංස්කෘතිය කෙරෙහි කොවිඩ්-19 හි බලපෑම

ඉහත පර්යේෂණයේ දී ඉස්මතු වූ පරිදි, 61.8% ක් නව මාධ්‍යයන්ට ප්‍රවේශ වීමෙන් කොවිඩ්-19 සම්බන්ධ තොරතුරු ලබා ගෙන ඇත. එන්නත් තොරතුරුවල සිට සෞඛ්‍ය සහ රජයේ මාර්ගෝපදේශ දක්වා වූ තොරතුරු, විශේෂයෙන් සෞඛ්‍ය සහ යහපැවැත්ම වැනි බරපතල ගැටළු සම්බන්ධයෙන් තොරතුරු ලබා ගැනීම සඳහා පුද්ගලයින් සමාජ මාධ්‍ය කෙරෙහි නව විශ්වාසයක් පෙන්වා ඇත. මහජනතාවට තොරතුරු හුවමාරු කර ගැනීමේදී නව මාධ්‍ය මාර්ග කොතරම් අත්‍යවශ්‍යද යන්න මෙයින් පැහැදිලි වේ. එබැවින්, අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස සම්බන්ධයෙන් වැදගත් විය යුත්තේ, මෙම නව මාධ්‍ය මාර්ග මගින් පුද්ගලයින්ට නිදහසේ තම අදහස් ප්‍රකාශ කිරීමට ඉඩ සලසා දෙන අතරම හානිකර සහ අන්තරාදායක විය හැකි "ව්‍යාජ පුවත්" අවම කිරීමට කටයුතු කිරීමයි.

"අන්තර්ජලය තුළ පලකරන ව්‍යාජ සහ නොමග යවන ප්‍රකාශ" වලට එරෙහිව විවාදයක් සඳහා "ව්‍යාජ පුවත්" පනතක් කෙටුම්පත් කිරීමේ යෝජනාවක් 2021 දී ශ්‍රී ලංකාවේ කැබිනට් අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කර ඇත[24]. මෙම පනත් කෙටුම්පත සිංගප්පූරුවේ මාර්ගස්ථ (Online) පුවත්වල ව්‍යාජ බව සහ හැසිරවීම් වලින් ආරක්ෂා කිරීමේ පනත ආදර්ශයට ගෙන සැලසුම්කර ඇති අතර එය රජයේ ප්‍රචාරණය සඳහා මෙවලමක් වීම සහ භාෂණයේ නිදහස සහ මාධ්‍ය පාලනය කිරීම සම්බන්ධයෙන් ද මතභේදයට තුඩු දී ඇත. එබැවින්, ශ්‍රී ලංකාව තුළ ඕනෑම "ව්‍යාජ ප්‍රවෘත්ති" සම්බන්ධ පනත් කෙටුම්පතක් මගින් මානව හිමිකම් උල්ලංඝනය නොකිරීම සහ පුද්ගලයන්ට නිදහසේ අදහස් ප්‍රකාශ කිරීමට ඉඩ සලසන අතරම ජීවිත අනතුරේ හෙළන ව්‍යාජ තොරතුරු පැතිරවීමෙන් ආරක්ෂා කිරීමට ප්‍රමාණවත් යාන්ත්‍රණයක් ඇති බව සහතික කිරීම ඉතා වැදගත් වේ. මෑතක් වන තුරු ප්‍රජාවේ අනෙකුත් සමාජිකයින්, මිතුරන්, පවුල්වල සාමාජිකයින් වැනි අය විවිධ පුවත් සහ එකිනෙකා සමග කතාබහ කිරීම එකට එකතු වී සම්මුඛව සිදු කරනු ලැබීය. කෙසේ වෙතත්, කොවිඩ්-19 වසංගතය හේතුවෙන් පනවන ලද භෞතික සීමාවන් පැනවීම සහ එක්රැස් වීම තහනම් කිරීම නිසා වැඩි පිරිසක් තම අදහස් ප්‍රකාශ කිරීමට සහ අන් අය සමග තොරතුරු සාකච්ඡා කිරීම සඳහා විවිධ අන්දමේ නව මාධ්‍ය වේදිකා සමග සම්බන්ධ වීම සිදු කරන ලදී. මෙමගින් නව මාධ්‍ය සමග පරිශීලකයින්ගේ සම්බන්ධතාවය දැඩි ලෙස වැඩි කලද, මෙම නව මාධ්‍ය වේදිකා සඳහා ප්‍රගතිය සහ යාන්ත්‍රණයන් ඊට අනුරූපව දියුණු නොවීමක් පෙන්නුම් කරන අතර එමගින් රට තුළ ඇතිවන වේගවත් ඩිජිටල් පරිවර්තනයට සරිලන ප්‍රමාණවත් යාන්ත්‍රණයක් නොමැති වීමෙන් සංවාදයේ වෙනසක් පෙන්නුම් කරයි.

### පරිශීලකයින් අතර ඩිජිටල් අනන්‍යතා නිර්මාණය කිරීමේදී නව මාධ්‍යයෙහි කාර්යභාරය

1) ප්‍රකාශනයේ නිදහස සහ රට තුළ ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් කිරීම වෙනුවෙන් පුරවැසි මාධ්‍ය කලාව ශක්තිමත් කිරීම සඳහා ක්‍රියාමාර්ග වැඩිදියුණු කිරීම සහ ක්‍රියාත්මක කිරීම. එනම් සමාජ, දේශපාලන හා සංස්කෘතික ගැටළු රාශියකට ඩිජිටල් ලෙස ආමන්ත්‍රණය කරන්නේ කෙසේද යන්න පිළිබඳව සමාන්‍ය ජනතාව ඉලක්ක කර වැඩමුළු පැවැත්වීම.
2) වෘත්තීය මාධ්‍යවේදීන්ගේ සහ විද්වතුන්ගේ පමණක් නොව සාමාන්‍ය පුවැසියන්ගේ ද බ්ලොග් සටහන් සහ අදහස් දැක්වීම් ප්‍රදර්ශනය කිරීම සඳහා මාර්ගගත වෙබ් අඩවි සහ මාර්ගගත මාධ්‍ය ආයතන දිරිමත් කිරීම.
3) පරිශීලකයන්ට ඔවුන්ගේ ඩිජිටල් අනන්‍යතා මුවහත් කර ගැනීමට ප්‍රගතිශීලී සහ අන්තර් ක්‍රියාකාරී පරිසරයක් පෝෂණය කිරීම සඳහා පුරවැසියන් ජාලගත කිරීමට, අදහස් බෙදා ගැනීමට සහ නිදහසේ අදහස් ඉදිරිපත් කිරීමට තවත් ඩිජිටල් අවකාශයක් ස්ථාපිත කිරීම.

### වැඩිදුර අධ්‍යයනය කිරීම සඳහා අධ්‍යයන ක්ෂේත්‍ර

පර්යේෂණය අතරතුර වැඩිදුර අධ්‍යයනය සඳහා ඉස්මතු වූ අධ්‍යයන ක්ෂේත්‍ර කිහිපයක් ඇති අතර, සිදු කරන ලද මෙම විශේෂිත අධ්‍යයනයට ඇති වූ බාධාවන් හේතුවෙන් ඒවා සවිස්තරාත්මකව විමර්ශණය කිරීමට නොහැකි වූ අතර ඒ පිළිබඳව වැඩිදුර පර්යේෂණ සිදු කිරීම අවශ්‍ය වේ. මෙම අධ්‍යයනයේදී එම ක්ෂේත්‍ර තරමක් දුරට ස්පර්ෂ කර ඇතත්, ශ්‍රී ලංකාවේ වෛරී ප්‍රකාශ සහ නව මාධ්‍ය පිළිබඳව විශේෂයෙන් සොයා බැලීම සඳහා වඩාත් පුළුල් ලෙස පර්යේෂණ කළ යුතුය. අන්තර්ජාලය හරහා වෛරී ප්‍රකාශ වර්ධනය වීම සහ නව මාධ්‍ය වේදිකා භාවිතා කරමින් අන්තවාදී කණ්ඩායම් නැවත හිස ඔසවමින් බඳවා ගැනීම් සහ මතවාදයන් ප්‍රචාරය කිරීම පිළිබඳව විමසා බැලිය යුතුය.

---

[24] https://ifex.org/sri-lanka-free-media-movement-said-fake-news-bill-could-undermine-freedom-ofexpression/

එපමණක් නොව, සිදු කරන ලද මෙම පර්යේෂණය මගින් ශ්‍රී ලංකාවේ තරුණයින් සහ බලපෑම් වයස් කාණ්ඩය යන දෙඅංශය විසින්ම භාවිතා කරන විවිධ සමාජ මාධ්‍ය වේදිකා හඳුනාගෙන ඇත. කෙසේ වෙතත්, වඩාත් ප්‍රමුඛත්වයක් ගන්නා සමාජ මාධ්‍ය වේදිකාවල පළ කෙරෙන දේවල්හි අන්තර්ගතයේ ස්වභාවය (වර්ගය) පිළිබඳව තවදුරටත් ගැඹුරින් විවරණය කළ යුතුය. යෙදුම් (application) භාවිතා කරන්නන්ට අදහස් ප්‍රකාශ කිරීමේදී දැනෙන නිදහසේ මට්ටම පරීක්ෂා කිරීමට මෙය උපකාරී විය හැකි අතර මාධ්‍ය වේදිකාව මත පදනම්ව ඔවුන්ගේ ඩිජිටල් අනන්‍යතා වෙනස් විය හැකි ආකාරය සහ වඩාත් ප්‍රකාශිත විය හැකි ආකාරය පිළිබඳව ද සොයා බැලිය හැක. තවද, මුදල් ගෙවා සිදු කරන ප්‍රවර්ධන කටයුතු සහ ප්‍රචාරණ ව්‍යාපාර වැනි දේ මගින් සමාජ මාධ්‍ය වේදිකා හරහා මුදල් ඉපයීමේ කාර්යභාරය පිළිබඳව පරීක්ෂා කිරීම සඳහා ද පර්යේෂණ කළ යුතුය. ෆේස්බුක් සහ ඉන්ස්ටග්‍රෑම් වැනි සමාජ මාධ්‍යවල වාණිජකරන පැත්ත පරිශීලකයින්ගේ අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස සීමා කිරීමට සහ අනෙක් අය කෙරෙහි යම් යම් දෘෂ්ටිකෝණයන් ප්‍රවර්ධනය කිරීමේ දී ප්‍රබල බලපෑමක් පෙන්නුම් කර ඇත.